**යෝග්‍යතා පරීක්ෂණය 2020/2021**
**ප්‍රසංග කලා අධ්‍යයන අංශය**
**ශ්‍රී පාලි මණ්ඩපය**
**කොළඹ විශ්වවිද්‍යාලය**

වර්තමානයේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුකොට ගෙන සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව, 2021 වර්ෂය සඳහා විද්‍යාර්ථීන් බඳවා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණය මාර්ගගත (online) ක්‍රමයට පැවැත්වීමට සිදු වී ඇත.

- ඒ සඳහා අවශ්‍ය සියලු උපදෙස් පහත සඳහන් ශ්‍රී පාලි මණ්ඩපයේ වෙබ් පිටුවෙහි ඇති Aptitude Test කොටසට පිවිසීමෙන් ලබා ගත හැකි ය.

  https://spc.cmb.ac.lk/index.php/aptitude2021/

- ප්‍රසංග කලා අධ්‍යයන අංශයට අදාළව යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින සෑම අපේක්ෂකයකු/ අපේක්ෂිකාවක සඳහාම විශ්වවිද්‍යාලය මගින් LMS ගිණුමක් විවෘත කර තිබේ. ඔබගේ සියලුම වීඩියෝ සහ pdf ගොනු එම ගිණුමට උඩුගත (upload) කළ යුතු ය.

- පහත සඳහන් සබැඳිය (link) ඔස්සේ LMS ගිණුමට පිවිසිය හැකි ය.

  https://lms.spc.cmb.ac.lk/course/index.php?categoryid=120

ප්‍රසංග කලා අධ්‍යයන අංශයට අදාළව යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින අපේක්ෂකයන්/අපේක්ෂිකාවන්, තමා විසින් ඉල්ලුම් කරන ප්‍රධාන විෂය/විෂයන් සඳහා පහත සඳහන් කර ඇති උපදෙස් මාලාව තරයේ අනුගමනය කළ යුතු ය.

## සිනමා අධ්‍යයනය (Film Studies)

01. අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් විනාඩි තුන (03) බැගින් වන වීඩියෝ දර්ශන දෙකක් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතු ය.

**වීඩියෝ අංක 01:** සපයා ඇති සිනමා කෘති අතරින් ඔබ කැමති එක් කෘතියක් තෝරා ගෙන, එහි තේමාව හඳුනා ගනිමින්, ඒ පිළිබඳ විචාරාත්මකව අදහස් දක්වන්න. (උපරිම කාලය විනාඩි 03 යි.)

**වීඩියෝ අංක 02:** එම සිනමා කෘතියේ කැමරාකරණය, ආලෝකකරණය, සංස්කරණය යන ශිල්පීය භාවිතයන් අතරින් එකක් පිළිබඳ පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන්න. (උපරිම කාලය විනාඩි 03 යි.)

- අදාළ සිනමා කෘති නැරඹීම සඳහා ඔබට ලබා දී ඇති LMS ගිණුමට පිවිසෙන්න.

02. ඔබ විසින් නිර්මාණය කර ඇති කෙටි චිත්‍රපට/වාර්තා චිත්‍රපට ආදිය තිබේ නම් ඒවා ගූගල් ඩ්‍රයිව් වෙත උඩුගත (upload) කර, එහි සබැඳිය (link) පමණක් ඔබට ලබා දී ඇති LMS ගිණුමට යොමු කළ යුතු ය.

- ගූගල් ඩ්‍රයිව් (Google Drive) වෙත ගොනුවක් උඩුගත (upload) කළ යුතු ආකාරය පොදු උපදෙස්වල දක්වා ඇත.

03. ඔබ ලබා ඇති පළාත්, ජාතික, අන්තර්ජාතික මට්ටමේ සහතික තිබේ නම් ඒවා ද ඇතුළත්ව, විෂය ක්ෂේත්‍රයට අදාළව ඔබ සතු කුසලතා පෙන්නුම් කෙරෙන ලියකියවිලි එකතුවක් සකසා, එහි pdf ගොනුවක් ඔබට ලබා දී ඇති LMS ගිණුමට යොමු කළ යුතු ය.

- උපරිම සහතික සංඛ්‍යාව 10 කට සීමා විය යුතු ය.
- ගොනුවෙහි ප්‍රමාණය (file size) මෙගා බයිට් 64ට අඩු විය යුතු ය.
- මෙම ලියකියවිලි ගොනුව පොදු උපදෙස්වල දක්වා ඇති ආකාරයට නම් කළ යුතු ය.

## චිත්‍ර හා සැලසුම්කරණය (Art & Design)

01. අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් විනාඩි එක (01) බැගින් වන වීඩියෝ දර්ශන තුනක් ඉදිරිපත් කළ යුතු ය.

- අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් නිශ්චල ද්‍රව්‍ය බලා ඇඳීම සහිත චිත්‍රයක් සම්පූර්ණ කළ යුතු ය. එහි දී සැලකිලිමත් විය යුතු කරුණු මෙසේ ය.

  චිත්‍රය සඳහා ගෝලය, සිලින්ඩරය, ඝනය, යන හැඩ තුන සහිත වස්තූන් තුනක් සහ රෙදි කැල්ලක් යන ද්‍රව්‍ය එකතුවක සංරචනයක් සකස් කර ගත යුතුය. (බෝලයක් හෝ පළතුරු ගෙඩියක්, බෝතලයක්, ඝනකම ඇති පොතක් හෝ පෙට්ටියක් වැනි වස්තූන් සුදුසු ය.)

**වීඩියෝ අංක 01:** ඇඳීමේ හා වර්ණ කිරීමේ ආරම්භය (විනාඩි 01 යි.)
**වීඩියෝ අංක 02:** අර්ධ වශයෙන් නිම වූ චිත්‍රය (විනාඩි 01 යි.)
**වීඩියෝ අංක 03:** චිත්‍රයේ නිමාව සහ නිශ්චල ද්‍රව්‍ය සංරචනය (විනාඩි 01 යි.)

- සෑම වීඩියෝවකම ආරම්භයේ දී අඳින්නාගේ මුහුණ පැහැදිලිව පෙන්වා, ඉන් අනතුරුව අඳින්නාගේ අත සහ චිත්‍රය පැහැදිලිව පෙනෙන පරිදි රූපගත කළ යුතුය. අවසාන භාගයේ දී අඳින්නා දෙසට කැමරාව නැවත හැරවිය යුතු ය.

- චිත්‍රයේ නිමාව පෙන්වන වීඩියෝව (වීඩියෝ අංක 03) අවසානයේ දී නිම කළ චිත්‍රය සහ බලා ඇඳීම සඳහා යොදා ගත් ද්‍රව්‍ය එකතුව පැහැදිලිව පෙන්විය යුතු ය.

02. විෂය ක්ෂේත්‍රයට අදාළව ඔබ ලබා ඇති පළාත්, ජාතික, අන්තර්ජාතික මට්ටමේ සහතික තිබේ නම් ඒවා පමණක් pdf ගොනුවක් ලෙස සකසා, ඔබට ලබා දී ඇති LMS ගිණුමට යොමු කළ යුතු ය.

- උපරිම සහතික සංඛ්‍යාව 10 කට සීමා විය යුතු ය.
- මෙම සහතික ගොනුව පොදු උපදෙස්වල දක්වා ඇති ආකාරයට නම් කළ යුතු ය.

## නාට්‍ය හා රංග කලාව (Drama & Theatre)

01. අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් විනාඩි දෙක (03) බැගින් වන වීඩියෝ දර්ශන දෙකක් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතු ය.

**වීඩියෝ අංක 01:** රංගන කෞශල්‍යය (උපරිම කාලය විනාඩි 03 යි.)
මෙයින් අපේක්ෂා කරනුයේ අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ රංගන කෞශල්‍යය පරීක්ෂා කිරීමයි. එය ස්වභාවික රංගන ශෛලියේ නිරූපණයක් විය යුතු අතර ඒ සඳහා උචිත ඕනෑම නාට්‍යයක කොටසක් යොදා ගත හැකි ය.

**වීඩියෝ අංක 02:** ප්‍රාසංගික හැකියාව (උපරිම කාලය විනාඩි 03 යි.)
මෙයින් අපේක්ෂා කරනුයේ අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ ප්‍රාසංගික හැකියාව පරීක්ෂා කිරීමයි. එය නාට්‍ය ගීතයක් ගායනා කරමින් ඉදිරිපත් කරන රංගනයක් විය යුතු ය.

02. විෂය ක්ෂේත්‍රයට අදාළව ඔබ ලබා ඇති පළාත්, ජාතික, අන්තර්ජාතික මට්ටමේ සහතික තිබේ නම් ඒවා පමණක් pdf ගොනුවක් ලෙස සකසා, ඔබට ලබා දී ඇති LMS ගිණුමට යොමු කළ යුතු ය.

- උපරිම සහතික සංඛ්‍යාව 10 කට සීමා විය යුතු ය.
- මෙම සහතික ගොනුව පොදු උපදෙස්වල දක්වා ඇති ආකාරයට නම් කළ යුතු ය.

## සංගීතය (Music)

01. අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් විනාඩි තුන (03) බැගින් වන වීඩියෝ දර්ශන දෙකක් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතු ය.

**වීඩියෝ අංක 01:** ඔබගේ ප්‍රධාන විෂය (ගායනය හෝ වාදනය) ට අනුකූලව ඔබ කැමති රාගයක් ඉදිරිපත් කරන්න. (උපරිම කාලය විනාඩි 03 යි.)

- රාගය ගායනය හෝ වාදනය කිරීමේ දී කෙටි ආලාප ඛණ්ඩයක්, ස්ථායි කොටස, තානාලංකාර තුනක් යන අංග පමණක් ඇතුළත් කළ යුතු ය.
- රාගය ගායනය හෝ වාදනය කිරීමේ දී සහාය තබ්ලා වාදනය සඳහා සහාය වාදකයකු හෝ ඉලෙක්ට්‍රොනික තබ්ලාව යොදාගත යුතු ය.

**වීඩියෝ අංක 02:** ඔබට වාදනය කළ හැකි විවිධ වාද්‍ය භාණ්ඩ වාදනය කොට පෙන්වන්න. (උපරිම කාලය විනාඩි 03 යි.)

- වාදනය ඉදිරිපත් කිරීමේදී ගායනා කරමින් වාදනය ඉදිරිපත් කිරීම අනිවාර්ය නැත.

02. විෂය ක්ෂේත්‍රයට අදාළව ඔබ ලබා ඇති පළාත්, ජාතික, අන්තර්ජාතික මට්ටමේ සහතික තිබේ නම් ඒවා පමණක් pdf ගොනුවක් ලෙස සකසා, ඔබට ලබා දී ඇති LMS ගිණුමට යොමු කළ යුතු ය.

- උපරිම සහතික සංඛ්‍යාව 10 කට සීමා විය යුතු ය.
- මෙම සහතික ගොනුව පොදු උපදෙස්වල දක්වා ඇති ආකාරයට නම් කළ යුතු ය.

## නර්තනය (Dancing)

01. අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් විනාඩි තුන (03) බැගින් වන වීඩියෝ දර්ශන දෙකක් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතු ය.

**වීඩියෝ අංක 01:** ඔබ කැමති සාම්ප්‍රදායික නර්තන අංගයක් ඉදිරිපත් කරන්න. (උපරිම කාලය විනාඩි 03 යි.)
**වීඩියෝ අංක 02:** නිර්මාණාත්මක නර්තන අංගයක් ඉදිරිපත් කරන්න. (උපරිම කාලය විනාඩි 03 යි.)

නර්තන අංග රූපගත කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

- සාමාන්‍ය පුහුණුවීමේ ඇඳුම් කට්ටලයෙන් සැරසී නර්තනයට පෙනී සිටීම අනිවාර්ය වේ.
- කිසිදු ආකාරයකින් වේෂ නිරූපණය (makeup) භාවිත නොකළ යුතු ය.
- නර්තනය ඉදිරිපත් කරන්නාගේ හිසේ සිට පාදාන්තය දක්වා සම්පූර්ණ රූපයම තිරයේ දිස් විය යුතුය.
- සාම්ප්‍රදායික නර්තනය ඊට අදාල වාදනයකටත්, නිර්මාණාත්මක නර්තනය ඔබ කැමති සංගීත ඛණ්ඩයකටත් අනුකූලව ඉදිරිපත් කළ යුතු ය.
- නර්තනයට අදාළ සභය වාදනය සඳහා සජීවී සභය වාදන ශිල්පීන්ගේ සහය ලබාගත හැකි ය.

02. විෂය ක්ෂේත්‍රයට අදාළව ඔබ ලබා ඇති පළාත්, ජාතික, අන්තර්ජාතික මට්ටමේ සහතික තිබේ නම් ඒවා පමණක් pdf ගොනුවක් ලෙස සකසා, ඔබට ලබා දී ඇති LMS ගිණුමට යොමු කළ යුතු ය.

- උපරිම සහතික සංඛ්‍යාව 10 කට සීමා විය යුතු ය.
- මෙම සහතික ගොනුව පොදු උපදෙස්වල දක්වා ඇති ආකාරයට නම් කළ යුතු ය.

**පොදු උපදෙස්**

- සියලුම විෂයයන් සඳහා ඉල්ලුම් කරන අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් සිය වීඩියෝ දර්ශන සකස් කර ගැනීමේ දී පහත දැක්වෙන නිර්ණායක කෙරෙහි පොදුවේ සැලකිලිමත් විය යුතු ය.

- අපේක්ෂකයා/අපේක්ෂිකාව සිය අනන්‍යතාව පැහැදිලිව දිස් වන පරිදි වීඩියෝවට පෙනී සිටිය යුතු ය.
- වීඩියෝ පටිගත කිරීම් සඳහා ජංගම දුරකථන භාවිතය වුව ද ප්‍රමාණවත් ය.
- තිරස් අතට (landscape ආකාරයෙන්) වීඩියෝ කළ යුතු ය.
- පැහැදිලි ආලෝක තත්ත්වයක් යටතේ රූපගත කළ යුතු ය.
- සංස්කරණය නොකරන ලද සජීවී පටිගත කිරීමක් ඉදිරිපත් කළ යුතු ය.

- එක් වීඩියෝ ගොනුවක ධාරිතාව (file size) මෙගා බයිට් 64 (64MB) ට වඩා අඩු විය යුතු ය.

- වීඩියෝ ගොනුවක ධාරිතාව අඩු කර ගත හැකි ආකාරය පැහැදිලි කෙරෙන වීඩියෝව නැරඹීම සඳහා පහත දැක්වෙන සබැඳියට (link) පිවිසෙන්න.

https://youtu.be/sgmE1T8A4UY

- වීඩියෝ ගොනුවක ධාරිතාව අඩු කර ගැනීමට අවශ්‍ය Hand Brake මෘදුකාංගය පහත දැක්වෙන සබැඳිය (link) ඔස්සේ බාගත කර ගන්න.

  https://handbrake.fr/downloads.php

- ගූගල් ඩ්‍රයිව් (Google Drive) වෙත ගොනුවක් උඩුගත (upload) කළ යුතු ආකාරය පැහැදිලි කෙරෙන වීඩියෝව නැරඹීම සඳහා පහත දැක්වෙන සබැඳියට (link) පිවිසෙන්න.

  https://youtu.be/GQVGr_OM18Q

- සියලුම වීඩියෝ සහ pdf ගොනු උඩුගත (upload) කිරීමේ දී එම ගොනුව ඔබට ලබා දී ඇති පරිශීලක නාමය (LMS user name) අනුව නම් (rename) කළ යුතු ය.

  උදාහරණ -

| | |
|---|---|
| සිනමා අධ්‍යයනය | AP21FSxxxx |
| චිත්‍ර හා සැලසුම්කරණය | AP21ADxxxx |
| නාට්‍ය හා රංග කලාව | AP21DRxxxx |
| සංගීතය | AP21MCxxxx |
| නැටුම් | AP21DNxxxx |

- අපේක්ෂකයකුට/අපේක්ෂිකාවකට තම LMS ගිණුමට ගොනු (files) උඩුගත (upload) කළ හැකි වන්නේ එක් වතාවක් පමණි. එබැවින් පළමු වතාවෙහිම නිවැරදි ගොනුව යොමු කිරීමට සැලකිලිමත් වන්න.

- යෝග්‍යතා පරීක්ෂණය සඳහා වලංගු වන්නේ 2014 වර්ෂයට පසුව ලබා ගත් සම්මාන හා සහතික පමණි. එම වර්ෂයට පෙර ලබා ගත් සහතික කිසිවක් ඉදිරිපත් නොකළ යුතු ය.

**සැලකිය යුතුයි !**

- ලකුණු ලබා දීමේ දී අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ ශිල්පීය දක්ෂතාව කෙරෙහි මිස, වීඩියෝවෙහි ගුණාත්මකභාවය කෙරෙහි සැලකිල්ලක් දක්වනු නොලැබේ.

- අදාළ අපේක්ෂකයා/අපේක්ෂිකාව වෙනුවට වෙනත් අයෙකු වීඩියෝවෙහි පෙනී සිටීම නීතිමය වශයෙන් වරදක් වන අතර, එවැනි අවස්ථාවල දී ඔබගේ අපේක්ෂකත්වය අවලංගු වේ.

- ව්‍යාජ සහතික හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා නීතිය අනුව දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි ව්‍යාජ තොරතුරු සැපයූ බවට අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත. ඔබ මෙම පරීක්ෂණයෙන් සමත්ව ශිෂ්‍යභාවය ලබාගත් පසුව වුව ද ව්‍යාජ තොරතුරු සහ සහතික පත්‍ර සපයා ඇති බවට අනාවරණය වුවහොත් එකී කරුණු මත ඔබගේ ශිෂ්‍යභාවය අහෝසි වන බව සිහි තබා ගත යුතු ය.

- ප්‍රසංග කලා අධ්‍යයන අංශයට අදාළව යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකු/ අපේක්ෂිකාවක විසින්ම මේ සමග අමුණා ඇති යෝග්‍යතා පරීක්ෂණය 2021 සහතික කිරීමේ ලිපියේ පිටපතක් තම අත් අකුරින් ම පුරවා සම්පූර්ණ කොට, නීතිඥවරයෙකු, සාම විනිසුරුවරයෙකු, විදුහල්පතිවරයෙකු, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා සහතික කිරීමෙන් අනතුරුව, ලිපිගොනුවේ මුල් පිටුව ලෙස අදාළ ලියකියවිලි සමග අමුණා උඩුගත (upload) කළ යුතු ය.

- ඉහත කරුණු සම්බන්ධව ඔබට ඇති වන ඕනෑම ආකාරයේ ගැටළුවක් මෙම ඊමේල් ලිපිනයට යොමු කරන්න.

  aptitude@spc.cmb.ac.lk

- අත්‍යාවශ්‍යම අවස්ථාවක දී පමණක්, රාජකාරි වේලාවන්හි දී සම්බන්ධීකාරක අමතා උපදෙස් ලබා ගන්න.

  0771860515

**යෝග්‍යතා පරීක්ෂණය - 2021**
**ප්‍රසංග කලා අධ්‍යයන අංශය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය**

**සහතික කිරීමේ ලිපිය**

…………………………..………………………………………………. (නම) වන මා විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ ප්‍රසංග කලා ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණය - 2021 සඳහා යොමු කරනු ලබන සියලුම සහතික මාගේ දක්ෂතා මත ලබාගත් ඒවා බවත්/ සියලුම ලිපි ලේඛන හා නිර්මාණ මා විසින් සිදු කළ ඒවා බවත්/ මෙම ලිපි ගොනුවේ ඇතුළත් සියලුම සහතික හා ලිපි ලේඛන ඒවායේ ම මුල් පිටපත්වල සත්‍ය පිටපත් බවත් සහතික කරමි.

මා විසින් එවා ඇති ලිපි ගොනුවේ පිටු ගණන ......... ක් බව සහතික කරමි.

මා විසින් එවන ලද සියලුම වීඩියෝ දර්ශන සඳහා පෙනී සිටින්නේ මා බවත්/ ඒවා මා විසින් සිදු කළ නිර්මාණ/ මා සම්බන්ධ වූ නිර්මාණ බවත් සහතික කරමි.

අයදුම්කරුගේ නම - ................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය - ...................................................................

අත්සන - .................................

දිනය - ....................................

ඉහත නම සඳහන් අයදුම්කරු අද දින මා ඉදිරියේ අත්සන් කළ බව සහතික කරමි.

බලයලත් නිලධාරියාගේ නම - .................................................................

අත්සන - .................................

නිල මුද්‍රාව -

දිනය - .....................................